# ටෙන්ඩර් දැන්වීමයි

## ආරක්ෂක අමාත්‍යාංශය

## ආරක්ෂක අමාත්‍යාංශය සතු සුඛෝපභෝගී වාහන, සුඛෝපභෝගී නොවන වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

01. ආරක්ෂක අමාත්‍යාංශයට අයත් පහත සඳහන් සුඛෝපභොගී වාහන සහ සුඛෝපභෝගී නොවන වාහන විකිණීම සඳහා මුද්‍ර, තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| කාණ්ඩය | ලොට් අංකය | වාහන අංකය | වාහන වර්ගය හා මාදිලිය | නිෂ්පාදිත වර්ෂය | ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ලේඛන ගාස්තුව (රු.) | ආපසු ගෙවන තැන්පතුව (රු.) |
|---|---|---|---|---|---|---|
| සුඛෝපභෝගී වාහන | 01 | GC -8363 | NISSAN PRIMERA CAR | 2000 | 5,000.00 | 50,000.00 |
| | 02 | KE-5375 | MICRO REXTON JEEP | 2007 | 5,000.00 | 50,000.00 |
| | 03 | 62-0774 | MITSUBISHI PAJERO JEEP | 1994 | 5,000.00 | 50,000.00 |
| | 04 | 65-6527 | NISSAN PATROL JEEP | 1999 | 5,000.00 | 50,000.00 |
| | 05 | 32-4039 | MITSUBISHI PAJERO JEEP | 1987 | 5,000.00 | 50,000.00 |
| | 06 | KA-5497 | NISSAN X.TRAIL JEEP | 2005 | 5,000.00 | 50,000.00 |
| | 07 | KF-5804 | MICRO REXTON JEEP | 2007 | 5,000.00 | 50,000.00 |
| | 08 | KA-4843 | TOYOTA LAND CRUISER JEEP | 2005 | 5,000.00 | 50,000.00 |
| | 09 | 32-7602 | MITSUBISHI PEJERO JEEP | 1989 | 5,000.00 | 50,000.00 |
| | 10 | KP-6809 | LAND ROVER DISCOVERY JEEP | 2011 | 5,000.00 | 50,000.00 |
| | 11 | KP-3525 | NISSAN PATROL JEEP | 2011 | 5,000.00 | 50,000.00 |
| සුඛෝපභෝගී නොවන වාහන | 12 | NA-9690 | TATA WINGER VAN | 2011 | 3,000.00 | 20,000.00 |

02. මිල ගණන් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත එක් එක් ලොට් අංකය සඳහා වෙන වෙනම ආපසු නොගෙවනු ලබන, ඉහත වගුවේ සඳහන් ටෙන්ඩර් පත්‍රිකා ගාස්තුව **2025.11.03 දින සිට 2025.12.02 දින දක්වා** කාර්යාලයීය දිනයන්හිදී **පෙ.ව.9.00 සිට ප.ව.3.00 අතර කාලය තුළ ආරක්ෂක අමාත්‍යාංශයේ, 2 වන මහලේ මූල්‍ය කළමනාකරණ අංශයේ සරප්** වෙත ගෙවා ටෙන්ඩර් පත්‍රිකා මිලදී ගත හැකිය. එම අවස්ථාවේදී වාහන පරික්ෂා කිරීම සඳහා අවසරපත්‍ද නිකුත් කරනු ලැබේ.

03. වාහන පරික්ෂා කිරීමෙන් අනතුරුව, ලංසු ඉදිරිපත් කිරීම සඳහා එක් එක් ලොට් අංකය සඳහා වෙන වෙනම ආපසු ගෙවන තැන්පතු මුදලද ආරක්ෂක අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවා එම කුවිතාන්සියේ පිටපතක් ටෙන්ඩර් පත්‍රකාවට අමුණා ඉදිරිපත් කළ යුතු වේ. සියලු ගෙවීම් මුදලින් පමණක් සිදුකළ යුතුය.

| | |
|---|---|
| ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකි කාර්යාලය හා ලිපිනය | ගණකාධිකාරී (ආදායම් හා වත්කම් කළමනාකරණය), දෙවන මහල, ආරක්ෂක අමාත්‍යාංශය,<br>ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ<br>දු.ක : 0112430860 දිගුව – 10521/10525<br>0112421690 / 0773603555<br>නම, ජාතික හැඳුනුම්පත් අංකය, වාහන අංකය සඳහන් කර 0773603555 යන WhatsApp අංකයට යොමු කිරීමෙන් අමාත්‍යාංශය වෙත ඇතුල්වීමේ අනුමැතිය ලබාගත යුතුවේ. |

04. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමෙන් අනතුරුව කාර්යාල වේලාවන් තුළ දී 2025.11.03 දින සිට 2025.12.02 දින දක්වා අකුරේගොඩ, අරුප්පිටිය මංසන්ධියේ ඇති ආරක්ෂක අමාත්‍යාංශයේ වාහන අංගණය හිදී වාහන පරික්ෂා කර බැලිය හැකිය.

05. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රිකා **2025.12.02 දින ප.ව. 12.00ට** හෝ ඊට පෙර ලැබෙන පරිදි **වාහන වෙන්දේසි කිරීමේ ටෙන්ඩර් මණ්ඩලය, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ** ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ එම ලිපිනයේ, ප්‍රධාන මූල්‍ය නිලධාරී (ගිණුම් හා මූල්‍ය) කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කළ හැකිය. ටෙන්ඩර් භාර ගැනීම 2025.12.02 වන දින ප.ව.12.00ට අවසන් වන අතර ඒ වහාම ආරක්ෂක අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේදී ඒවා විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. මිල ගණන් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සුඛෝපභෝගී වාහන, සුඛෝපභෝගී නොවන වාහන මිලදී ගැනීම සඳහා වූ ටෙන්ඩර්"** යනුවෙන් සහ මිල ගණන් ඉදිරිපත් කරනු ලබන **"කාණ්ඩය සහ ලොට් අංකය"** සඳහන් කළ යුතුය.

07. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට ලංසුකරු හෝ බලයලත් නියෝජිතයෙකු සහභාගී වීම අනිවාර්යය වේ. එසේ සහභාගී නොවන ලංසුකරුවන්ගේ ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ආරක්ෂක ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර,**
**කෝට්ටේ**

**දිනය: 02.11.2025**